# දේශගුණික ක්‍රියාකාරකම් සඳහා වන තරුණ සාමූහිකයේ ගෝලීය අරමුදල

# Youth Climate Action Fund

> "දේශගුණික විපර්යාස යනු සැමගේම සහභාගිත්වය අවශ්‍ය වන අභියෝගයකි. එහිදී වඩාත්ම අවදානමට ලක්ව සිටින තරුණ පරපුර මේ සඳහා නායකත්වය දීමට දායක වීම අතිශයින්ම තීරණාත්මක වේ."

දේශීය දේශගුණික විසඳුම් සංවර්ධනය කිරීම සඳහා තරුණ තරුණියන් සමඟ නගර සහයෝගීතාවයෙන් කටයුතු කරන ආකාරය ශක්තිමත් කිරීම සඳහා තරුණ දේශගුණික ක්‍රියාකාරී අරමුදල (Youth Climate Action Fund) සමග 2026 වසරේ එක් වූ ලොව පුරා නගර 300කින් යුත් ගෝලීය කණ්ඩායමකට ඔබේ ගම්පොල නගරය ද එක් වූ බව සතුටින් දැනුම් දෙනු කැමැත්තෙමු.

මෙම වැඩසටහන හරහා වයස අවුරුදු 15 සිට 24 දක්වා වූ 300,000කට අධික තරුණ තරුණියන් පිරිසක් ගෝලීය දේශගුණික අභියෝග මැඩ පැවැත්වීම සඳහා එක් වනු ඇත.

මෙම වැඩසටහන මඟින් තරුණ තරුණියන්ගෙන් නව අදහස් මතු කර ගැනීමටත්, ක්ෂුද්‍ර ආධාර (Micrograntts) මඟින් ඔවුන්ට සහාය වීමටත්, දේශීය දේශගුණික ප්‍රමුඛතා ඉදිරියට ගෙනයාම සඳහා තරුණ තරුණියන් සම්බන්ධ කර ගැනීමට නගර සතු හැකියාවන් වර්ධනය කිරීමටත් අවශ්‍ය පසුබිම සකස් කරයි.

නගරයේ තරුණ කණ්ඩායම් වෙතින් ව්‍යාපෘති යෝජනා කැඳවා ඒවායින් තෝරා ගන්නා ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීමට ආධාර මුදල් ලබා දීම මෙහි දී සිදු කෙරෙයි.

**වැඩසටහන කෙටියෙන්:**

| | |
|---|---|
| සහභාගී වන නගර | මහද්වීප හයක් පුරා නගර 300ක් |
| නගරයකට ලැබෙන අරමුදල් | නගරයකට ඇමරිකානු ඩොලර් 40,000 බැගින් |
| ව්‍යාපෘති සඳහා මූල්‍ය ආධාර ප්‍රදාන | ව්‍යාපෘතියකට උපරිමය ඇමෙරිකානු ඩොලර් 5000 දක්වා |
| නගරයකට ව්‍යාපෘති සංඛ්‍යාව | තරුණ කණ්ඩායම් මෙහෙයවන දේශගුණික ව්‍යාපෘති 8ක් |
| සහභාගී වන තරුණ පිරිස | වයස අවුරුදු 15 - 24 ත් අතර |
| ව්‍යාපෘති යෝජනා කැඳවීමේ සිට ව්‍යාපෘතිය අවසන් කිරීම දක්වා ඇති සමස්ත කාලය | 2026 ජූලි 27 සිට 2027 අප්‍රේල් 15 දක්වා |

නිරන්තරයෙන් දේශගුණික විපර්යාස වල බලපෑමට සහ ආපදා වල බලපෑම් වලට යටත් වන ගම්පොල නගරයට, පසුගිය දිත්වා ආපදාව වැනි ව්‍යසනකාරී ආපදා රැසක අත්දැකීම් ඇත. ගම්පොල පරිසරය, ජන ජීවිතය සහ දේපොළ වල සුරක්ෂාව වෙනුවෙන් ගත හැකි කෙටි කාලීන සහ දිගු කාලීන විසඳුම් පිළිබඳව ගම්පොල නගර සභාව ලෙස අපත් රජයත් අවධානය යොමු කර ඇති නමුත්, ප්‍රජාව ලෙස ඔබ සතුව ද ඒ වෙනුවෙන් නිර්මාණශීලී

සහ ප්‍රායෝගික විසඳුම් ඇති බව අපි තරයේ විශ්වාස කරන්නෙමු. විශේෂයෙන් ම තරුණ ප්‍රජාව සතුව වඩාත් නව්‍ය වූ අදහස ඇති බැවින්, ඒවා යතාර්ථයක් කළ හැකි නම් එය සුන්දර සහ සුරක්ෂිත ගම්පොලක් වෙනුවෙන් ඇති අප සැමගේ සිහිනය සැබෑ කරගන්නට එය මහත් ශක්තියක් වනු ඇත.

ඒ අනුව ගම්පොල නගරයේ "දේශගුණික විපර්යාස ක්‍රියාකාරී සැළසුම" යටතේ හඳුනාගෙන ඇති පහත තේමා වලට අදාළව තරුණ ඔබගේ ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කළ හැක.

- නායයෑම් සහ ගංවතුර අවදානම් අවම කිරීම: අපගේ අවදානමට ලක්විය හැකි කඳුකර ප්‍රදේශ සහ ගංගා ද්‍රෝණි ආරක්ෂා කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමේ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති සංවර්ධනය කිරීම, අවදානම් සිතියම්කරණය සහ ස්වභාවධර්මය පදනම් කරගත් ඔරොත්තු දීමේ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.
- නාගරික හරිතකරණය සහ තාපය අවම කිරීම: අපගේ නගර මධ්‍යය තුළ වර්ධනය වන නාගරික තාප දූපත් බලපෑමට (urban heat island effect) එරෙහිව සටන් කරමින්, වඩාත් සිසිල් සහ ඔරොත්තු දෙන ගොඩනඟන ලද පරිසරයක් නිර්මාණය කිරීම සඳහා නාගරික හරිත අවකාශයන් සහ ගස් ආවරණය පුළුල් කිරීම.
- තිරසාර අපද්‍රව්‍ය කළමනාකරණය: පරිසර හායනය අවම කිරීම සඳහා නව්‍ය චක්‍රීය ආර්ථික ආකෘති (circular economy models) හඳුන්වා දීම, එක්වරක් පමණක් භාවිත කරන ප්ලාස්ටික් භාවිතය අඩු කිරීම සහ කාබනික අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය වැඩිදියුණු කිරීම.

සම්පූර්ණ සැළසුම සඳහා පහත සබැඳිය භාවිතා කරන්න:

https://gampola.uc.gov.lk/pdf/Gampola%20Urban%20Council_CAP.pdf

## තරුණ දේශගුණික ක්‍රියාකාරී අරමුදල (Youth Climate Action Fund - YCAF) ක්ෂුද්‍ර ආධාර ව්‍යාපෘති:

### ➢ YCAF ක්ෂුද්‍ර ආධාර ව්‍යාපෘතියක් යනු කුමක්ද?

ඔබේ නගරයේ ප්‍රමුඛතාවලට අනුකූල වන, තරුණයින් මෙහෙයවන දේශගුණික ව්‍යාපෘති සඳහා සහාය වන මූල්‍ය ප්‍රදානයන් වේ. ඒවා සැලසුම් කර ඇත්තේ තරුණ තරුණියන්ගෙන් නව අදහස් මතු කර ගැනීමට සහ ඔවුන්ගේ ප්‍රජාවන් තුළ ක්‍රියාත්මක වීමට ඔවුන්ට අවස්ථාව සලසා දීමටය.

ක්ෂුද්‍ර ආධාර ව්‍යාපෘතියක් සපුරාලිය යුතු අවශ්‍යතා:

- වයස අවුරුදු 15-24 අතර අවම වශයෙන් තරුණ තරුණියන් දෙදෙනෙකු විසින් යෝජනා කර, සැලසුම් කර, මෙහෙයවිය යුතුය.
- ඔබේ නගරයේ දේශගුණික ප්‍රමුඛතාවලට අනුකූල විය යුතුය.
- 2026 නොවැම්බර් 13 දින ආරම්භ කර 2027 අප්‍රේල් 15 බ්‍රහස්පතින්දා දිනට පෙර නිම කළ යුතුය.
- අනුමත වියදම් පමණක් භාවිත කරමින් ඩොලර් 1,000 සිට 5,000 දක්වා වූ අයවැයක් තුළ ක්‍රියාත්මක විය යුතුය
- තරුණ නායකත්වය සහ ක්‍රියාකාරීත්වය කෙරෙහි අවධානය යොමු කළ යුතුය; උපකරණ සහ යටිතල පහසුකම් පිරිවැය සමස්ත ව්‍යාපෘති අයවැයෙන් 50% නොඉක්මවිය යුතුය.

ව්‍යාපෘති උදාහරණ :

| ව්‍යාපෘති උදාහරණය | නිමැවුම් උදාහරණ (Output) | ප්‍රතිඵල උදාහරණ (Outcome) |
|---|---|---|
| නගරයේ උද්‍යාන පිරිසිදු කිරීමේ මාලාවක් සංවිධානය කිරීම | තරුණයින් මෙහෙයවන පිරිසිදු කිරීමේ ඉසව් සංඛ්‍යාව | එකතු කරන ලද කුණු බෑග් සංඛ්‍යාව |
| දේශගුණයට අදාළ නගර සභා රැස්වීම් පිළිබඳ පුවත් පත්‍රිකාවක් ආරම්භ කිරීම | පුවත් පත්‍රිකාව සඳහා ලියාපදිංචි වූ තරුණ පිරිස | ප්‍රසිද්ධ නගර සභා රැස්වීම්වලට සහභාගී වූ තරුණ පිරිස |
| පාසල්වල ගෘහස්ථ වැසි උද්‍යාන කට්ටල නිර්මාණය කර බෙදා හැරීම | බෙදා හරින ලද වැසි උද්‍යාන කට්ටල සංඛ්‍යාව | වගා කරන ලද වැසි උද්‍යාන සංඛ්‍යාව |
| ආහාර අපද්‍රව්‍ය පොහොර බවට පත් කිරීමේ සහයෝගීතාවයක් ආරම්භ කිරීම | නිෂ්පාදනය කරන ලද පොහොර ප්‍රමාණය | භාවිතා  කරන ලද ආහාර අපද්‍රව්‍ය ප්‍රමාණය (රාත්තල් වලින්) |

➢ ක්ෂුද්‍ර ආධාර ලබා ගත හැක්කේ කාටද?

ව්‍යාපෘති මෙහෙයවනු ලබන්නේ තරුණ තරුණියන් විසින් වුවද, අරමුදල් නිකුත් කළ යුත්තේ ලියාපදිංචි සංවිධාන වෙතය. සුදුසුකම් ලබන සංවිධානවලට ඇතුළත් වන්නේ:

- තරුණයින් මෙහෙයවන සංවිධාන (උදා: තරුණ සමාජ හෝ කණ්ඩායම්)
- තරුණයින් සඳහා සේවය කරන සංවිධාන (තරුණ තරුණියන්ට සහාය දෙන වැඩිහිටියන් මෙහෙයවන සංවිධාන)
- අනුග්‍රාහක සංවිධාන (උදා: නගර ආයතන, පාසල් හෝ වෙනත් අධ්‍යාපන ආයතන හෝ ප්‍රජා සංවිධාන)

*****පුද්ගලික සමාගම්, තනි පුද්ගලයන්, දේශපාලන පක්ෂ හෝ දේශපාලන පක්ෂවලට අනුබද්ධ සංවිධාන මේ සඳහා සුදුසුකම් නොලබයි.***

YOUTH CLIMATE ACTION FUND
Supported by Bloomberg Philanthropies

- සුදුසුකම් ලබන සහ නොලබන වියදම්

**සුදුසුකම් ලබන වියදම්:**

- ව්‍යාපෘති සැපයුම් සහ ද්‍රව්‍ය (උපකරණ, මෙවලම්, කලා ද්‍රව්‍ය හෝ තාක්ෂණික උපාංග කුලියට ගැනීම හෝ මිලදී ගැනීම)
- ප්‍රජා උත්සව, වැඩමුළු හෝ අධ්‍යාපනික සැසි සංවිධානය කිරීමේ පිරිවැය (ස්ථාන කුලිය, මුද්‍රණ පිරිවැය, මූලික සංග්‍රහයන්)
- දේශීය රෙගුලාසිවලට අනුකූලව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය බලපත්‍ර සඳහා වන පිරිවැය
- තරුණ සහභාගිවන්නන්ගේ හෝ ව්‍යාපෘතියට සෘජුවම සම්බන්ධ කණ්ඩායම් සාමාජිකයන්ගේ සාධාරණ ගමන් වියදම් (පොදු ප්‍රවාහන, ටැක්සි)
- ව්‍යාපෘතිය පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම සඳහා ප්‍රවර්ධන ද්‍රව්‍ය (ඡායාරූපකරණය, වීඩියෝකරණය, සංස්කරණ සහාය)

**සුදුසුකම් නොලබන වියදම්:**

- පවතින නගර සභා වැඩසටහන් මඟින් දැනටමත් ආවරණය වන සේවා/වියදම්
- නිවාස කුලී හෝ උපයෝගිතා ගාස්තු (විදුලි, ජල ආදී)
- ලාභ නොලබන සංවිධාන/රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමේ ගාස්තු
- දේශන පාරිතෝෂික හෝ කථික ගාස්තු
- ශිෂ්‍යත්ව හෝ පුද්ගලයන්ට/පවුල්වලට ලබා දෙන සෘජු මූල්‍ය ආධාර
- දේශපාලන ව්‍යාපාර, අරමුදල් රැස්කිරීම් හෝ පක්ෂ දේශපාලන දායකත්වයන්

**අයදුම් කිරීම:**

ඔබ උක්ත සුදුසුකම් සපුරාලන කණ්ඩායමක් තරුණ නම් ඔබේ ව්‍යාපෘති යෝජනාව මෙම වෙබ් අඩවියේ ඇති ව්‍යාපෘති යෝජනා ආකෘතිය පුරවා ycafgampola@gmail.com විද්‍යුත් ලිපිනයට යොමු කරන්න. නැතහොත් ගම්පොල නගර සභා ප්‍රධාන කාර්යාලයට ගෙනැවිත් භාර දෙන්න.

ව්‍යාපෘති කාල රාමුව -

- අයදුම්පත් භාර ගැනීම ආරම්භය - 2026 ජූලි 27
- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය - 2026 සැප්තැම්බර් 07

ව්‍යාපෘති ඇගයීම සහ ක්ෂුද්‍ර ආධාර ලැබීමට සුදුසුකම් ලබන ව්‍යාපෘති 8ක් තෝරා ගැනීම, තරුණ දේශගුණික ක්‍රියාකාරී අරමුදලේ මාර්ගෝපදේශ යටතේ ගම්පොල නගර සභාව විසින් පත් කරන ලද ස්වාධීන ඇගයීම් මණ්ඩලයක් විසින් සිදු කරනු ඇත. එම මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

**විමසීම් සඳහා: පහනි ෆර්නැන්ඩු 077 973 3139**